| අ/විජයරාජ මහා විද්‍යාලය | |
| --- | --- |
| පළමු වාර පරීක්ෂණය - 2025 | භූගෝල විද්‍යාව I - 10 ශ්‍රේණිය |
| නම:- ............................................... | කාලය පැය 03 |
| උපදෙස් - ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න | |

<u>**අංක 01- 10දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න**</u>

01.පෘතුවිය මතුපිට වර්ග ප්‍රමාණයේ වර්ග කිලෝමීටර්මිලියන .................. පමණ වේ. (510/610/710)

02.වර්ෂණය මගින් පෘථිවිය මතට ලැබෙන ජලයෙන් කොටසක් භූමිය මතුපිට ගලා යාම.............. ලෙස හැඳින්වේ.(කාන්දුවීම ,අපදාවය, ඝනීභවනය)

03පෘථිවි කබොලේ මහද්වීපික කොටස.................... පාෂාණ වලින් බහුල කලාපයකි (සිලිකා, ග්‍රැනයිට්, මැග්නීසියම්)

04.මැඩකස්කර දූපත.................. මහද්වීපය තටකය තුළ පිහිටා ඇත.(ආසියා ,අප්‍රිකා ,ඕස්ට්‍රේලියා)

05මානව ක්‍රියාකාරිත්වයෙන් වැඩිපුරම සිදුවන්නේ ......................ගෝලය තුළය (පරිවර්ති, අපරිවර්ති, මෙසෝ)

06.සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක අතර ජීවීන් සිටින එකම ග්‍රහලෝකය ...............................වේ. (අඟහරු,පෘථිවිය,බුද )

07. පෘථිවි කබොල ප්‍රාවරණයෙන් වෙන් වන්නේ ............................අසන්තතියෙනි. (ගුටෙන් බර්ග් ,මොහොරෝ විස්ක්,ලෙහ්මන්)

08.පෘථිවි කබොල සියල් හා.................... යන ස්ථර දෙකෙන් සමන්විත වේ. (හරය, සිමැග්, ප්‍රාවරණය)

09.සිංදු ගඟ ගලා බසින්නේ...............ට ය. (අරාබි මුහුද, බෙංගාල බොක්ක, රතු මුහුද)

LIVEWORKSHEETS

10.ජීවීන්ගේ ස්වසනය සඳහා අවශ්‍ය ඔක්සිජන් වායුව සැපයීම,ප්‍රභා සංස්ලේෂණයට අවශ්‍ය කාබන් ඩයොක්සයිඩ් සැපයීම..............................කාර්යයන් වේ.

(වායුගෝලයේ ,ජලගෝලයේ ,ශිලා ගෝලයේ)

***අංක 11සිට 20 තෙක් ඇදී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් (නි)යන්න යන්න ද වැරදි නම් (වැ) යන්න වටා ද රවුමක් අඳින්න.**

11උන්නතාංශය සමඟ ක්‍රමයෙන් උෂ්ණත්වය ඉහළ යාම පරිවර්ති ගෝලයේ විශේෂ ලක්ෂණයකි.(නි/වැ)

12.පෘථිවි තලයෙන් 71% ම සාගරයෙන් වැසී පවතී.(නි/වැ)

13.පෘථිවි කබොලේ සීමා ස්ථරය දරා සිටින මූලික පාෂාණ ස්ථරය සියල් ස්ථරයයි. (නි/වැ)

14.ගුරුත්වා බලය නිසා වායුගෝලය පෘතුවිය හා බැඳී පවතී(නි/වැ)

15.පෘථිවිය ඇතුළත හරය ද්‍රවමය ලෝහ වලින් සමන්විත වේ.(නි/වැ)

16ඛනිජ සම්පත් ලබා ගැනීමේදී සිදුවන භූමි හායනය ශිලාගෝලයට ඇති කරන අහිතකර බලපෑමකි(නි/වැ)

17. පෘථිවි තලයේ සිට කිලෝමීටර් 5-6 දක්වා කලාපය තුළ මුළු වායු ගෝලීය පරිමාවෙන් 50% පමණ අඩංගු වෙයි

(නි/වැ)

18.භූගත ජලය ලෙස ගැනෙන්නේ භූමියේ මතුපිට විල්, ගංගා ,ඇළ දොළ ජලාශවල ඇති ජලයයි(නි/වැ)

19. ලෝකයේ උසම ස්ථානයක පිහිටා ඇතිවිල ටිටිකාවිලයි(නි/වැ)

20.කෙටි කාලයක් තුළ වායුගෝලයේ පවත්නා සාමාන්‍ය තත්ත්වය දේශගුණයයි(නි/වැ)

LIVEWORKSHEETS

<u>10 ශ්‍රේණියේ භූගෝල විද්‍යාව</u>

<u>දෙවන ප්‍රශ්න පත්‍රය.</u>

*** පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01. i. පහත ලෝක ආකෘති සිතියමේ පහත සඳහන් දේ ලකුණු කර නම්කරන්න.

1. ඕස්ට්‍රේලියා මහද්වීපය
2. පැපුවා නිව්ගිනියා
3. කළු මුහුද
4. අත්ලාන්තික් සාගරය
5. ඇට්ලස් කඳු
6. බොල් කැෂ් විල


02. i. ශිලා ගෝලයේ කොටස් දෙක නම් කරන්න.

ii. ශිලා ගෝලයේ ඇති සම්පත් මිනිසා විසින් ප්‍රයෝජනයට ගැනීමේදී ශිලාගෝලයට ඇති ඇතිවන බලපෑම් තුනක් නම් කරන්න.

iii. වායුගෝලය යනු කුමක්ද?

iv. පෘථිවි පද්ධතියේ උප පද්ධති හතර නම් කරන්න.

03.




I. මෙම රූප සටහනේ C හා D වලින් දක්වා ඇති වායුගෝලීය ස්ථර දෙක පිළිවෙලින් නම් කරන්න.

ii. පරිවර්ති ගෝලයේ විශේෂ ලක්ෂණ තුනක් ලියන්න

iii. වායුගෝලයේ සංයුතිය අනුව වායුගෝලෙයේ බහුලවම ඇති වායු වර්ග තුන පිළිවෙලින් නම් කරන්න.

iv. වායුගෝලයෙන් මිනිසාට ඇති ප්‍රයෝජන දෙකක් හා මිනිසාගේ ක්‍රියාකාරකම් හේතුවෙන් වායුගෝලයට එක්වන අහිතකර වායු වර්ග දෙකක් නම් කරන්න

LIVEWORKSHEETS

04. i. ජෛව ගෝලයේ ක්‍රියාකාරීත්වය සඳහා බලපාන සාධක දෙකක් නම් කරන්න

ii. පෘථිවි ව්‍යුහයේ ප්‍රධාන ස්ථර තුන නම් කරන්න

iii. ශිලා ගෝලයේ ප්‍රධාන භූතැටි තුනක් නම් කරන්න

iv. ජෛව ගෝලය යනු කුමක්දැයි කෙටියෙන් සඳහන් කර එහි සීමාවන් දක්වන්න

05. i. ආසියා මහද්වීප තටකය තුළ පිහිටි දූපත් දෙකක් නම් කරන්න

ii. ලෝකයේ අක්ෂාංශීය උෂ්ණත්ව ව්‍යාප්තිය පදනම් කරගත් ප්‍රධාන දේශගුණික කලාප තුන නම් කරන්න

iii. ලෝක දේශගුණික වර්ගීකරණය ඉදිරිපත් කරනු ලැබූ පුද්ගලයන් තිදෙනෙකු නම් කරන්න

iv. ඔබ ප්‍රදේශයේ දේශගුණය මානුෂ කටයුතු කෙරෙහි බලපාන ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

06. i. ලෝකයේ විශාලතම විල හා ලෝකයේ උසම ස්ථානයක පිහිටි විල නම් කරන්න.

ii. දූපතක් යනු කුමක්ද?

iii. අර්ධ වශයෙන් ගොඩබිම් වලින් වටවූ මුහුදු 3ක් නම් කරන්න.

iv. ගංගා හා විල් මානුෂ ක්‍රියාකාරකම් වලදී වැදගත්වන ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න.

LIVEWORKSHEETS